# පරිසරය රැකීමට

ගතවූ දශක කිහිපය තුළ මෙරටේ ස්වභාවික පරිසරය විශාල ලෙස වෙනස් වී ඇත. මෙයට එක් හේතුවක් වී ඇත්තේ, කෘෂිකර්මයෙන් යැපෙන දිළිඳු ජනතාව සිය ජීවනෝපාය සඳහාත්, රාජ්‍ය ප්‍රතිපත්ති මත ගොවි ජනපද පිහිටුවීම සඳහාත් විශාල ලෙස අපේ ස්වභාවික වනාන්තර එළි පෙහෙළි කිරීමට සිදුවීම ය. කඳුකරයේ කැලෑ එළි කිරීමත්, දේශගුණික රටාව වෙනස් වීමත් නිසා අපේ ජල සම්පත් අඩු වී ඇත. මෙයට මූලික හේතුවක් වී ඇත්තේ වැරදි වගා ක්‍රමයන්ය. විශේෂයෙන් ඉතා ඉහළ බෑවුම් සහිත කඳුවල පස සංරක්ෂණය පිළිබඳ මූලික ක්‍රමයන් පවා නොසළකා කරනු ලබන වැරදි වගා ක්‍රම මෙලෙස ජල සම්පත් අඩු වීමට හේතු සාධක වී තිබේ. සාරවත් මතුපිට පස විනාශ කරන මෙම පුරුද්ද වහාම නැවැත්විය යුතුය. මේ පිළිබඳව නිදහසට කරුණු වශයෙන් පැවසෙන්නේ එම ප්‍රදේශ වල සිටින පිරිස් ජීවත් වීම සඳහා මෙසේ කරනු ලබන බවයි. එය එසේ නම් මීට පිළියම වන්නේ එම පිරිස් විකල්ප ප්‍රදේශ වල පදිංචි කර වීමත්, ජලය, පස, ජලාශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම දිරි ගැන්වෙන වගා රටාවන්ට ඔවුන් හුරු කරවීමත් ය. මේ පිළිබඳව තවමත් අවශ්‍ය පමණට පියවර ගෙන නොමැතිවීම ඛේද ජනකය.

මෙම විනාශය මගහැරීම සඳහා ගතහැකි තවත් පියවරක් නම් ගොඩ ඉඩම් වල වගා කටයුතු වලදී ස්වභාවික සම්පත් සුරැකෙන භෝග වලට මුල් තැනක් දී කටයුතු කිරීමයි. උදාහරණයක් වශයෙන් ගොඩ ඉඩම් වල, පලතුරු, එළවළු හා කෙසෙල් වගාව හා සත්ත්ව පාලනය වැනි ගොවිතැන් ක්‍රම ඒකාබද්ධ කර ස්වභාවික සම්පත් රැකගත හැකිය.

## සම්පත් රැකීම

අනෙක් වැදගත් කරුණ වන්නේ දැනට පවතින ස්වභාවික සම්පත් රැක ගැනීමය. විශේෂයෙන් ස්වාභාවික ජල සම්පත් රැක ගැනීමට උපරිම ප්‍රයත්න දැරිය යුතුය. උදහරණයක් වශයෙන් ජල උල්පත් හා ඇල දොල ආරක්ෂා කරනු පිණිස, විශාල ලෙස අතු පතර විහිදෙන වෘක්ෂ රෝපණය කළයුතු වෙයි.

මේ මගින් පස සුරැකෙන අතර ඉතා දරුණු නියං සමයකදී වුවද ජල උල්පත් හා ඇලදොළ සිඳියාම වලකිනු ඇත. මේ සඳහා උපයෝගී කර ගතහැකි දේශීය ගස් වර්ග රැසක් අප සතුව ඇත. ජල සම්පත් සුරැකීමේ අනෙක් පියවර විය යුත්තේ අපේ කැලෑ එළි කිරීම නැවැත්වීම යි. මෙහි මූලික පියවරක් වශයෙන් දැව කැපීම පිළිබඳව දැඩි ක්‍රියා මාර්ග ගත යුතුව ඇත.

## ජල මාර්ග

නොයෙක් ආකාරයේ අපද්‍රව්‍ය ජල මාර්ග වලට එකතුවීමෙන් ජලය අපිරිසිදු වීම, රටේ ජනතාවගේ සෞඛ්‍යයට බෙහෙවින් බලපාන කරුණකි. මෙරට කර්මාන්තශාලා වලින් එන අපවිත්‍ර ජලය සහ අපද්‍රව්‍ය ජලමාර්ග වලට හරවා තිබීම මෙරට සුලබ දර්ශනයකි. මෙරට වගකිවයුත්තන් ගේ අවධානයට මෙම ප්‍රශ්ණය යොමු නොවීම අවාසනාවට කාරණයකි. මෙම තත්ත්වය මගහැරවීම ටත්, මෙම ජලය පිරිසිදු කිරීමටත් ඉතා පහසු ක්‍රියා මාර්ග ගත හැකිව තිබෙන නමුත්, ඒ ගැන කිසිවකු සැලකිල්ලක් දක්වන්නේ නැත. උඩරට වතුකරයේ වාසීන් ට නොයෙක් අන්තර් ජාතික සංවිධාන මගින් වැසිකිලි පහසුකම් සලසා ඇත. එම වැසිකිලි දර ඇහිරීම වැනි වෙනත් කටයුතු සඳහා යොදවමින් එම වැසියන් වැසිකිලි වෙනුවට ජල මාර්ග පාවිච්චි කිරීමද ජලය අපවිත්‍ර වීමට හේතු වී තිබේ. මෙය නතර කිරීමට අපගේ අවධානය යොමුවිය යුතුය.

අපේ ප්‍රධාන ආහාරය සැපයෙන වී වගාව පිළිබඳව සලකා බැලීමේදී පැහැදිලිව පෙනී යන කරුණක් නම් වල් පැලෑටි මැඩලීමේ අරමුණින් විශාල ලෙස ජලය පාවිච්චි කරන බවයි. කුඹුරු



මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ගරු පී. සී. ඉඹුලාන විසිනි

වල වල් පැලෑටි පැලවීම වැලැක්වීම සඳහා අඟල් 4 ක පමණ ජල මට්ටමක් රඳවා තැබීමේ පුරුද්ද පැල සිටුවීම මගින් මග හැරිය හැකිය. එමගින් වල් පැලෑටි මර්ධනය පහසු වන අතර පාරිසරික ප්‍රශ්ණ රැසක්ද විසඳා ගත හැකිය.

## කෘමි නාශක

පරිසරයට බලපාන අනෙක් විනාශය වන්නේ කෘමි නාශක හා දිලීර නාශක අක්‍රමවත්ව පාවිච්චි කිරීමයි. අවිචාර වත්ව මෙම ද්‍රව්‍ය පාවිච්චි කිරීම තුළින් කෘමීන් පමණක් නොව පරිසරයේ ස්වභාවිකව කෘමී මර්ධනයට ඇති හැකියාවද විනාශ කොට ඇත. කෘමී හා දිලීර නාශක ඇල දොළ වලට මිශ්‍රව යෑමෙන් ජලජ ජීවීන් විනාශයට මෙන්ම ඒවා දූෂණයටද හේතුවේ. එමෙන්ම මෙලෙස කෘමිනාශක යෙදූ ආහාර පාරිභෝජනය කිරීමෙන් අනාගත පරපුරේ සෞඛ්‍ය හා ජීවන තත්ත්වයට කුමක් සිදු වේදැයි කිසිවෙකුට කිව නොහැකි ය. මෙ මගින් අනාගතයේදී ඇති වන රෝග පීඩාදිය ගැන කෙනෙකුට කළ හැක්කේ සිතින් මවා ගැනීමක් පමණක් වන හෙයිනි.

# ...ත ශුභ පියවර

මෙරටේ සිදුවී ඇති පරිසර විනාශය පෙන්වන තවත් අංශයක් ලෙස අපේ සම්ප්‍රදායික කෘමි මර්ධන ක්‍රම අභාවයට යාම පෙන්වා දිය හැකිය. දැනට දශක කිහිපයකට පෙර අපේ ගොවි ජනතාව රසායනික කෘමි නාශක වෙනුවට දේශිය ද්‍රව්‍ය යොද ගත්හ. දළුක් කිරි යොද ගන්නා ලද ඉදලක් මාර්ගයෙන් කුඹුරෙහි වින කෘමීන් එකතු කළ ඔවුහු එම කෘමීන් වළලා දැමූහ. මෙබඳු පිළිවෙත් වර්තමානයේ දැකිය නොහැක. බොහෝ ප්‍රදේශ වල දළු ක් ගසක් පවා දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. එයට අමතරව මැසි මදුරුවන් නිවසට ඒම වැලැක්වීමටත්, පහන් දැල්වීමටත් උපයෝගි කර ගත් කැකුණ ගස් අද දක්නට පවා ලැබෙන්නේ කලාතුරකිනි.

පරිසරයට බලපාන සහ ගොවියාගේ ආර්ථිකයට බලපාන වැදගත් සාධකයක් වනුයේ රසායනික පොහොර භාවිතය යි. රසායනික පොහොර මිළ ඉහළ යෑම හේතුවෙන්, ගොවිතැනට එම පොහොර භාවිතා කිරීම ගොවියාට විශාල බරක් වී ඇත. එම නිසා කොම්පෝස්ට්, කොළ පොහොර, ගොම වැනි කාබනික පොහොර යෙදවීම ගැන ගොවියාගේ අවධානය යොමු කළයුතු වේ. පැළෑටි වීම සඳහා අවශ්‍ය නයිට්‍රජන්, යකඩ, මැන්ගනීස්, මැග්නිසියම් ආදී මූලද්‍රව්‍ය කාබනික පොහොරවල විශාල වශයෙන් අඩංගු වේ. එම නිසා කොම්පෝස්ට් වැනි පොහොර යෙදීමෙන් පසු සඳහන් කළ ද්‍රව්‍යයන් පසට එකතු කළ හැකිවේ. වැටමාර වැනි කොළ වර්ග, සත්ත්ව අවශ්‍ය, ලි අළු වැනි ද්‍රව්‍ය කොම්පෝස්ට් සෑදීමේදී පාවිච්චි කළහැකි ය. මේවා යොයාගත හැකි ද්‍රව්‍යය ය. රසායනික ද්‍රව්‍ය මෙන් නොව, මේවා භාවිතයේදී වැඩි ප්‍රමාණයක් යෙදවීමට සිදුවේ.

## ජීව වායුව

ජීව වායු භාවිතය ගොවියා උනන්දු කළයුතු තවත් ක්ෂේත්‍රයකි. බොහෝ ගවබද ගොවියෝ ගවයන් ඇති කරන බැවින්, ඔවුන්ට මෙය ලේසියෙන් කරගත හැක. නමුත් ඒ සඳහා මූලික ආධාර දීමේ ක්‍රමයක් සකස් කළ යුතුවේ.

විදුලිය සැපයීම සඳහා ඉන්ධන භාවිතය දැන් බෙහෙවින් කරන බැවින්, එය පරිසර දූෂණයට මෙන්ම රටේ ආර්ථික වද බෙහෙවින් බලපායි. එබැවින්, මේ ප්‍රශ්ණ දෙකම විසඳිය හැකි ක්‍රමයක් නම් සූර්ය තාප බලය ලබා ගැනීමයි. හිරු එළිය බෙහෙවින් ලැබෙන රටක් වන ශ්‍රී ලංකාවට මෙය වියදමක් නොමැති ව ලබාගත හැකි බලයකි. මේ සඳහාද යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කිරීම වැදගත්වේ.

## වී ගොවිතැන

වී ගොවිතැන ගැන සඳහන් කිරීමේදී මධ්‍යම පළාතේ ක්‍රියාත්මක වන නියමු ව්‍යාපෘති තුනක් ගැන සඳහන් කළ යුතුය. නුවරඑළිය, ගම්පොල හා මහනුවර පාසැල් සිසුන්ගේ සහභාගිත්වයෙන් කෙරෙන මෙම නියමු ව්‍යාපෘති වලින් සිදු කෙරෙන්නේ මනා ජල පාලනයක් සහිතව පැල සිටුවීම මගින් නිෂ්පාදනය ඉහළ දැමීමයි. අක්කර පහක දහයක යායක සිදු කෙරෙන මෙම ක්‍රියාවලිය මගින් අසල්වැසි ගොවි ජනතාවට ආදර්ශයක් ගත හැකි අතර එයට සහභාගි වන අපේ තරුණ පරපුරට ගොවිතැන රැකියාව කර ගැනීමට අවශ්‍ය දැනුමද ලබාගත හැකිය. විශේෂ යෙන් රජයේ රැකියා හිඟ මෙවැනි යුගයක අනාගත පරපුරට මෙම දැනුම ලබාදීම කිහිප ආකාරයකින්ම වැඩ දයකය.

ආහාරමය හා වෙනත් අංශ පිළිබඳව සළකන විට අනේක් විශාල තම පරිසරයට සිදුව ඇති තර්ජනය වී ඇත්තේ හිරිගල් කැඩීමය. එමගින් අපගේ කුඩා රට මුහුදු කෑමට බිලිවන අතර ජනතාවගේ ආහාරයේ වැදගත් තැනක් ගන්නා මත්ස්‍ය නිෂ්පාදනයටද තර්ජන එල්ල වී ඇත. මෙම හිරිගල් විනාශය නිසා මෙරටේ ප්‍රචලිතව පැවැති මත්ස්‍ය වර්ග රාශියක් දැනටම අභාවයට ගොස් ඇත. මේ සඳහා පිලියම විය යුත්තේ එම කාර්යයෙහි නියුතු ජනතාවට වෙනත් රැකියා ලබා දීම පමණක් නොව, හිරිගල් භාවිතය අඩුවන ආකාරයට, ඒවාට විකල්පයන් සැපයීමය.

## ඉන්ධන

අපේ පරිසරයට වින කරන තවත් අංගයක් නම් ප්‍රවාහනයට යොදගෙන ඇති රථවාහන සමූහයයි. ඉතා සුළු ශක්තියක් අවශ්‍ය වාහන වලට පවා විශාල බල සහිත ඇන්ජිම් සවි කොට ඇති අතර මේ මගින් මෙරටට ඉතා වටිනා විදේශ විනිමය වැය කර ගෙවනු ලබන බල ශක්තිය අපතේ යන අතරම පරිසරය දූෂණයටද හේතුකාරක වී ඇත. මෙම අංශයේ ප්‍රතිසංවිධානයක් මෙනිසා අවශ්‍ය වේ.

ඉහත දක්වන ලද ප්‍රශ්නයන්ට පිළියම් යෙදීමට තවමත් ප්‍රමාද නැත. අප සැවොම එක්වී ඇත ඉතිහාසයේ සිට අප සතුව තිබූ ස්වභාවික උරුමයන් ජාතික සම්පත් - වෘක්ෂ තුරුලතා හා වන ජීවීන් රැක ගැනීමට එකිනෙකා අත්වැල් බැඳගෙන එක් විය යුතු කාලය එළඹ ඇත.

මෙතෙක් විවිධ මත වාදයන්ට ගොදුරු වී තිබූ අපේ රටට, දැන් නව යුගයක් උදාවී ඇත. සෑම කෙනෙකුටම සිය අභිලාෂය හා හැකියාව අනුව රටට සේවයක් කිරීමට දැන් අවකාශ ලැබී ඇත. විවිධ හැඟීම් වලට නතුව සිටි ජන කොටස් දැන් මානව වර්ගයාගේ යහපත සඳහා සිය යුතුකම් ඉටු කිරීමට පෙරමුණු ගෙන සිටිති. එහෙයින් මෙරට ඉතිහාසයේ සන්ධිස්ථානයකට පැමිණ සිටින මේ අවස්ථාවේදී අපේ මුතුන් මිත්තන් දයාද කළ උරුමයන් සුරැකිව රැකගෙන මෙරට දියුණු කිරීමේ කාර්යය තරුණ පරපුර වෙත පැවරී ඇති බව සඳහන් කළ යුතුය.